Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# තනතුරු - ඇබෑර්තු

## හෝමියෝපති වෛද්‍ය සභාව

හෝමියෝපති වෛද්‍ය සභාවේ හෝමියෝපති වෛද්‍ය නිලධාරි තනතුරට බඳවා ගැනීම

හෝමියෝපති වෛද්‍ය සභාව මගින් ආරම්භ කරනු ලබන රජයේ හෝමියෝපති නව වෛද්‍ය සායන සඳහා හෝමියෝපති වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීමට පහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුර** :- හෝමියෝපති වෛද්‍ය නිලධාරි

**02. පත්වීමේ ස්වභාවය** :- ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

**03. වැටුප් ක්‍රමය** :- සේවා ගණයට අදාල කේත අංකය හා මාසික වැටුප් පරිමාණය
MM 1-1-2016 : රු: (53,175-10×1,375-15×1,910-95,575/-)

**04. අවශ්‍ය සුදුසුකම්** :- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් වසර පහ හමාරකට නොඅඩු උපාධි පාඨමාලාවක් හැදෑරීමෙන් පසු ලබාගත් හෝමියෝපති වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම;

*හෝ*

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් වසර හතරකට නොඅඩු පූර්ණ කාලීන හෝමියෝපති වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම හා ඉන් පසුව වසර 03 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම;

*සහ*

අවම වශයෙන් වසරක සීමාවාසික පුහුණුවක් ලබාතිබීම, හෝමියෝපති වෛද්‍යවරයෙකු වශයෙන් හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

අවම වශයෙන් එක් වසරක දේශීය හෝ විදේශීය රෝහලක, ආයතනයක හෝ සායනයක වෘත්තීමය (වෛද්‍ය චිකිත්සා අංශයෙන්) පළපුරුද්දක් ලබා තිබීම. (ප්‍රතිකාර කළ රෝගීන්ගේ නාම ලේඛණය සහ එම ආයතනයේ සේවය කළ බවට අදාළ ආයතනයේ නිල මුද්‍රාව සහිත ආයතන ප්‍රධානීන්ගෙන් හෝ පෞද්ගලිකව පවත්වාගෙන ගිය ආයතනයක් නම් අදාළ ආයතනය පවත්වාගෙන යනු ලැබූ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය මගින් සනාථ කළ යුතු ය.)

**05. වයස් සීමාව** :- අවු. 25 ට නොඅඩු විය යුතු අතර අවු. 50 ට නොවැඩි විය යුතු ය.

**06. වෙනත්** :- සෑම ඉල්ලුම්කරුවෙක්ම,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

**07.** බඳවා ගැනීමේ ක්‍රමවේදය :- පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත පදනම් වූ කුසලතා අනුපිළිවෙලට අනුව බඳවා ගනු ලැබේ.

**08.** සුදුසුකම් ලබන දිනය :- සේවයට/තනතුරට පත්කිරීම සඳහා ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙස පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත 4,5 හා 6 යන වගන්ති වන සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණකි.

**09.** අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය :- අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී සෑම ආකාරයකින්ම සම්පූර්ණව හා නිවැරදිව ඉදිරිපත් කළ යුතු අතර 4 හා 5 යන වගන්තිවලින් දැක්වෙන සුදුසුකම් සනාථ කිරීම සඳහා නිසිපරිදි සහතික කරනු ලද අධ්‍යාපන හා අනෙකුත් සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතු වේ.

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**10.** පත්වීම් බලධාරියා වනුයේ හෝමියෝපති වෛද්‍ය සභාව වන අතර එහි තීරණය අවසාන තීරණය වේ.

ඔබ විසින් සකස් කරන ලද ඉල්ලුම් පත්‍රයක්,

**වෛද්‍ය ටී.එම්.එන්.පී.තෙන්නකෝන්,**
ලේඛකාධිකාරී(*වැ.බ.*)

හෝමියෝපති වෛද්‍ය සභාව,
අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත,
වැලිසර,
රාගම.

යන ලිපිනයට 2026 සැප්තැම්බර් මස 18 දිනට පෙර යොමු කළ යුතු ය.

09 - 45